# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1801/6 – 2013 මාර්තු 12 වැනි අඟහරුවාදා – 2013.03.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 74 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/10/2012/යූඩීජ්/290.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: බීඩී/යූපී/ඉඩම්/1/අත්පත්/1/5/7.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 මාර්තු මස 01 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, ඌව පරණගම.

2. **ඉඩමේ විස්තරය.**– ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යටිපළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, වැවේගෙදරගම (අ.ග.පි. 440) ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක බී/යූවීපී/2012/473 හා 2012.11.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 2.2816 ක් පමණ වූ පහත නම් සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – හියුගෝලෑන්ඩ් වත්ත – ප්‍රමාණය: හෙක්. 2.2816**
උතුරට: රජය හිමිකම් කියන ලුණුවත්ත නගර භූමිය සහ මල්වත්ත වැවිලි සමාගම හිමිකම් කියන හියුගෝලෑන්ඩ් වත්ත; නැගෙනහිරට: මල්වත්ත වැවිලි සමාගම හිමිකම් කියන හියුගෝලෑන්ඩ් වත්ත සහ මාර්ගය; දකුණට: මාර්ගය සහ එස්. මුන්ඩයියා හිමිකම් කියන හියුගෝලෑන්ඩ් වත්ත; බටහිරට: එස්. මුන්ඩයියා හිමිකම් කියන හියුගෝලෑන්ඩ් වත්ත සහ රජය හිමිකම් කියන ලුණුවත්ත නගර භූමිය.

03 – 1030

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2013 අංක 75 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4/3/10/2012/යූඩීජ්/290.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: බීඩී/යූපී/ඉඩම්/1/අත්පත්/1/5/7.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2013 මාර්තු මස 01 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, ඌව පරණගම.

2. **ඉඩමේ විස්තරය.**– ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඌව පරණගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, යටිපළාත කෝරළේ සුළු කොට්ඨාසයේ, උනපාන (අ.ග.පි. 439) ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක බී/යූවීපී/2012/472 හා 2012.11.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.7097 ක් පමණ වූ පහත නම් සඳහන් ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – හියුගෝලැන්ඩ් වත්ත – ප්‍රමාණය: හෙක්. 0.7097**
උතුරට: මල්වත්ත වැවිලි සමාගම හිමිකම් කියන හියුගෝලැන්ඩ් වත්ත, රජය හිමිකම් කියන ලුණුවත්ත නගර භූමිය සහ මාර්ග; නැගෙනහිරට: මාර්ගය සහ මල්වත්ත වැවිලි සමාගම හිමිකම් කියන හියුගෝලැන්ඩ් වත්ත; දකුණට: මල්වත්ත වැවිලි සමාගම හිමිකම් කියන හියුගෝලැන්ඩ් වත්ත සහ මාර්ගය; බටහිරට: මාර්ගය, මල්වත්ත වැවිලි සමාගම හිමිකම් කියන හියුගෝලැන්ඩ් වත්ත සහ රජය හිමිකම් කියන ලුණුවත්ත නගර භූමිය.

03 – 1031

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.